# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වයඹ හෘද රෝග නිවාරණ සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**වයඹ හෘද රෝග නිවාරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩග්ලස් දේවානන්ද මහතා විසින්
2016 අගෝස්තු මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජූලි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[130 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# වයඹ හෘද රෝග නිවාරණ සංගමය (සංස්ථාගත කිරීමේ)

## වයඹ හෘද රෝග නිවාරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"වයඹ හෘද රෝග නිවාරණ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට, සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එම සංගමය සංස්ථාගත කිරීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක    දරන වයඹ හෘද රෝග නිවාරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වයඹ හෘද රෝග නිවාරණ සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) වයඹ හෘද රෝග නිවාරණ සංගමයේ සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වයඹ හෘද රෝග නිවාරණ සංගමය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලතල හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) හදවත් රෝගීන් සඳහා අවශ්‍ය රෝහල් සහ රෝහල් ආම්පන්න, වෛද්‍ය පහසුකම් සහ වෙනත් අවශ්‍ය පහසුකම් සැලසීම;

(ආ) හදවත් රෝගීන් සඳහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් ද්‍රව්‍ය සහ මූල්‍යමය පහසුකම් සලසා දීම;

(ඇ) හදවත් රෝග ඇතිවීම වැළැක්වීම සහ ඒ හා සම්බන්ධ සම්මන්ත්‍රණ, දේශන සහ වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ; සහ

(ඈ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර ආනුෂංගික වන හෝ විය හැකි වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වා ගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාරගැනීම හෝ එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන නිලධාරීන් සහ එවැනි තවත් පුද්ගලයින් සංඛ්‍යාවකින් සමන්විත පරිපාලන කමිටුවක් විසින් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලා අස්වීම්, ඉවත් කිරීම් හෝ මරණය නිසා පරිපාලන කමිටුවේ ඇතිවිය හැකි පුරප්පාඩු සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා නීති රීතිවලට අනුකූලව තෝරා පත්කර ගත යුතු ය.

(3) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිලතල දරමින් සිටින සාමාජිකයින්ගෙන් සංස්ථාවේ මුල්ම පරිපාලන කමිටුව සහ ක්‍රියාකාරී කමිටුව සමන්විත වනු ඇත.

සංස්ථාවේ නීති රීති.

**6.** (1) සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම පිණිස එහි කටයුතු කළමනාකරණය සඳහා අවශ්‍ය වන නීති රීති, එනම් සංස්ථාවේ සාමාජිකයින් බඳවා ගැනීමට, ඉවත් කිරීමට හෝ නෙරපීමට අවශ්‍ය වන නීති රීති, නිලධාරීන් තෝරා පත් කර ගැනීමට අවශ්‍ය වන නීති රීති, සංස්ථාවේ කටයුතු කර ගෙන යාමට අවශ්‍ය වන ක්‍රියාමාර්ග හෝ වෙනත් සාමාන්‍ය නීති රීති මෙම පනතේ විධිවිධානවලට හෝ වෙනත් ලිඛිත නීතියකට පටහැනි නොවන පරිදි සංස්ථාවේ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් විටින් විට පනවා ගැනීම නීත්‍යානුකූල වේ.

(2) ඉහත අනු ඡේද අංක 1 හි සඳහන් වන ආකාරයේ රැස්වීමක දී එහි සඳහන් ආකාරයෙන් කටයුතු කර සංස්ථාව විසින් පනවා ඇති නීති රීති සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(3) මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙර දින සංගමයේ බලපවත්නා නීති රීති, මෙම පනතේ විධිවිධානයන්ට හෝ වෙනත් ලිඛිත නීතියකට පටහැනි නොවන තාක්, මෙම ඡේදයේ සඳහන් නීති රීති ලෙස සැලකිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ නීති රීතිවලට යටත් වන්නා හ.

සංස්ථාවට ලැබිය යුතු සහ සංස්ථාවෙන් ගෙවිය යුතු මුදල්.

**7.** මෙම පනතේ අවශ්‍යතාවයන්ට අනුව, මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙර දින පවතින සංගමයේ ණය සහ වගකීම් මෙයින් ස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලුම ණය මුදල්, දයක මුදල්, සාමාජික ගාස්තු සහ පරිත්‍යාග ආදිය සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින්මතු භාර ගනු ලබන පරිත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, ත්‍යාග හෝ ගාස්තු වශයෙන් ලැබෙන මුදල් පරිපාලන කමිටුව හෝ කෘත්‍යාධිකාරී කමිටුව විසින් හෝ තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර නැතහොත් අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇත්තේ ය. එවැනි දේපළ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ, බදු දීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ද පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** සංස්ථාවේ මුද්‍රාව කෘත්‍යාධිකාරී කමිටුවේ ලේකම් භාරයේ තිබිය යුතු අතර, පරිපාලන කමිටුවේ සභාපති සහ තවත් එක් කමිටු සාමාජිකයකු ඉදිරිපිට දී මිස එය කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන්, ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම්පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ වෙනත් යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.